# පානදුර ප්‍රාදේශීය සභාව
# කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය ලේඛණ හා ණයහිමි ප්‍රතිපාදන අනුව සමාලෝචිත වර්ෂයේ වීථි ආලෝක උපකරණ මිලදී ගැනීම් සහ ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම් පිළිවෙලින් රු.3,717,814 ක් සහ රු.1,502,881 ක් වුවද, වර්ෂයේ මිලදී ගැනීම් ලෙස පිළිවෙලින් රු.3,628,229 ක් හා රු.2,135,677 ක් ගබඩා තොග ගිණුම්වලට ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.65,350 කට මිලදී ගෙන තිබූ වත්කම් විෂයයන් 03 ක් ප්‍රාග්ධනිත කර තිබියදී නැවත විවිධ භාණ්ඩ තොග මිලදී ගැනීම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව කර්මාන්ත ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය රු.70,483,379 ක් වුවද රු.65,732,928 ක් පමණක් උපචිත කර තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.167,182,420 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,292,601 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.46,445,192 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) 2014 දෙසැම්බර් 31 දින වන විට මිය ගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 16 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.189,448 ක් විය.

(ආ) වර්ෂ ගණනාවක සිට අය නොවී ඉදිරියට ගෙන එමින් පැවත එන වීථි ලාම්පු ආධාර ශේෂය රු.7,437,096 ක්ද, පෙර ගෙවුම් ශේෂය රු.1,717,893 ක්ද විය.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 24,239 | 13,850 | 20,571 |
| (ii) බදු කුලී | 4,265 | 3,234 | 4,127 |
| (iii) බලපත්‍ර ගාස්තු | 196 | 176 | 32 |
| (iv) වෙනත් ආදායම් | 22,439 | 22,439 | -- |

2.3.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.19,596,648 ක් විය. විගණිත දිනය වූ 2015 ජූනි 30 වන විට ඉන් රු.4,273,569 ක් පමණක් අයකරගෙන තිබුණි. හිඟ ශේෂය තුළ රු.10,000 ට වඩා වැඩි හිඟ ශේෂයක් සහිත දේපල 53 ක් වූ අතර එකතු වටිනාකම රු.1,124,641 ක් විය. ඉහත හිඟ ශේෂයෙන් රු.9,180,754 ක් කෙසෙල්වත්ත උප කාර්යාල බල ප්‍රදේශයෙන් අයවිය යුතු විය.

2.3.3 **ව්‍යාපාර බදු**

2014 දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.723,831 ක් වූ අතර විගණිත දිනය වූ 2015 ජූනි 30 වන විට ඉන් රු.104,260 ක් පමණක් අයකරගෙන තිබුණි. වාද්දුව උප කාර්යාලයේ ව්‍යාපාර බදු ලේඛන අනුව වර්ෂ 1 සිට 4 දක්වා කාලයක් ව්‍යාපාර බදු නොගෙවූ ව්‍යාපාරිකයින් 215 ක් විය.

2.3.4 **කර්මාන්ත බදු**

2014 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ශේෂය රු.224,210 ක් වූ අතර 2015 ජූනි 30 දිනට රු.16,750 ක් පමණක් අයකරගෙන තිබුණි. වාද්දුව උප කාර්යාලයේ කර්මාන්ත බදු ලේඛන අනුව වර්ෂ 1 සිට 4 දක්වා කාලයක් කර්මාන්ත බදු නොගෙවූ කර්මාන්ත හිමියන් 78 ක් විය.

2.3.5 **වෙළඳ බලපත්‍ර ගාස්තු**

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තුවලින් රු.11,550 ක් විගණිත දිනය වූ 2015 ජූනි 30 දිනටත් හිඟව පැවතුණි.

2.3.6 **ගොඩනැගිලි කුලී**

කෙසෙල්වත්ත උප කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන පොලිස් ස්ථානයෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.4,127,084 ක් වූ කුලී විගණිත දිනය වූ 2015 ජූනි 30 දින වන විටත් අය වී නොතබුණි. කෙසෙල්වත්ත උප කාර්යාලයෙන් ලබා දුන් ආදායම් වාර්තා අනුව ඉහත හිඟ ශේෂය රු.4,178,482 ක් විය.

2.3.7 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

රු.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,111,528 |
| (ii) | මුද්දර ගාස්තු | 50,000,000 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය මගින් ප්‍රතිපාදන සලසා නොතිබියදි 2012 මාර්තු 06 දිනැති සභාපතිගේ අනුමැතිය පදනම් කරගෙන සභාවේ සභාපති, උප සභාපති හා මන්ත්‍රීවරුන්ගේ නිවාස සඳහා පුවත්පත් සැපයීම වෙනුවෙන් 2014 වර්ෂයේදී රු.141,485 ක්ද, 2013 වර්ෂයේදී රු.155,135 ක්ද, 2012 වර්ෂයේදී රු.57,020 ක්ද සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.2 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

(අ) **<u>එකම කාලසීමාවක් තුල එකම සමිතියකින් ඉදිකිරීම් කොන්ත්‍රාත් කිහිපයක් ඉටු කිරීම</u>**

2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2012 අනුව ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී, අදාල ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 3 කට වඩා වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත් එයට පටහැනිව 2014 පෙබරවාරි මාසයේ සිට එකම කාලසීමාවක් තුළ එක් සමිතියක් විසින් කොන්ත්‍රාත් 06 ක් සිදු කර තිබුණි.

(ආ) **<u>වේරගම අල්විස් මාවතේ සම්පත් කේන්ද්‍රය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම</u>**

වේරගම අල්විස් මාවතේ සභා ඉඩමක තනා තිබූ සම්පත් කේන්ද්‍රය රු.496,223 ක් සභා අරමුදල් වැය කර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංස්කරණය කර තිබුණි. 2015 මැයි 22 දින සභාවේ තාක්ෂණ නිලධාරි සමග සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී පහත කරුණු නිරික්ෂණය විය.

(i) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 2 අනුව ½ ₺ විෂ්කම්භය සහිත මෘදු වානේ කම්බියක් පාස්සා කම්බි දැල සවි කළ හැකි සේ නිම කිරීමට හා දෙවරක් මල ප්‍රතිරෝධක තීන්ත ආලේප කිරීම සඳහා රු.165,375 ක් ඇස්තමේන්තු කර රු.161,325 ක් ගෙවා තිබුණද පාස්සා තිබුණේ ¼ ₺ ප්‍රමාණයේ කම්බියක් වන අතර එහි කිසිදු තීන්ත ආලේපයක් කර නොතිබූ බැවින් මල බැඳෙමින් පැවතුණි.

(ii) ගොඩනැගිල්ල පිහිටි ඉඩම සම්පූර්ණයෙන්ම වල් බිහිවී තිබූ අතර ඉදි කිරීම් කිසිදු පරිහරණයකින් තොරව අත්හැර දමා තිබුණි.

(ඇ) **<u>මොල්ලිගොඩ උතුර සේවා පියසේ උඩු මහලේ වැඩ නිම කිරීම</u>**

(i) ඇස්තමේන්තු වැඩ විෂය අංක 116(16) ට අනුව දෙන ලද උපදෙස් අනුව අඩි 3 ක් උස අත්වාරු තරප්පුවට සපයා සවි කර දැව කොටස් මූලික ආලේපය සහ පොලියුරතීන් වානේ ආලේපය මගින් නිම කිරීම වෙනුවෙන් රු.61,000 ක් ඇස්තමේන්තු කර එම මුදලම ගෙවා තිබුණද දැවයෙන් සකසනු ලැබූ අත් වාරුවේ සම්බන්ධක දැව කණු 5 සඳහා දැව මූලික ආලේපය හෝ පොලියුරතීන් වානිෂ් ආලේප කර නොතිබූ අතර දැවයෙන් සැකසූ කොටස් සියල්ල අව්වට හා වැස්සට නිරාවරණය වීම හේතුවෙන් දුර්වරණ වී තිබුණි.

(ii) ඇස්තමේන්තු වැඩ විෂය අංක (11) ට අනුව කොන්ක්‍රීට් පොලොව 1:3 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් බිම් අතුරණය දමා වර්ණ ගැන්වූ සිමෙන්ති කොලපු මගින් මැද නිම කිරීම වෙනුවෙන් රු.45,105 ක් ඇස්තමේන්තු කර රු.43,856 ක් ගෙවා තිබුණද කොන්ක්‍රීට්

පොලොව මත දමා තිබූ වර්ණ ගැන්වූ සිමෙන්ති කොලපු මගින් නිම කර මතුපිට මැදීම සිදු කර නොතිබුණි.

(iii) ඇස්තමේන්තු වැඩ විෂය අංක 115(9) අනුව ගිනි සපු හෝ අනුමත වර්ගයේ දැව සපයා වඩිම්බු ලෑලි සවි කර නිම කිරීම සඳහා රු.13,972 ක් ඇස්තමේන්තු කර එම මුදලම ගෙවා තිබුණද වඩිම්බු ලෑලි සඳහා මතුපිට තීන්ත ආලේප කර නොතිබුණි.

(iv) උඩුමහලේ ගෙබිම සහ බිත්ති සඳහා ස්කර්ටින් යෙදීමට ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් නිමාව සම්පූර්ණ වී නොතිබුණි.

(ඇ) **<u>ගොරකාන සුසානභූමියේ දැරීම් බිත්තිය හා ආරක්ෂිත වැට ඉදිකිරීම (2 අදියර)</u>**

(i) ඇස්තමේන්තු වැඩ විෂය අංක 7 ට අනුව විෂ්කම්භය 3₺ ක් හා 3.6 mm ඝණකම GI පයිප්ප සපයා තීන්ත ආලේප කර සවි කිරීම සඳහා රු.200,880 ක් ඇස්තමේන්තු කර එම මුදලම ගෙවා තිබුණද සවි කර තිබූ GI පයිප්පවල විෂ්කම්භය 2 ½ ₺ ක් පමණක් විය.

(ii) ඇස්තමේන්තු වැඩ විෂය අංක 8 ට අනුව 20 mm x 6 mm ප්‍රමාණයේ පැතලි යකඩ පටි සපයා 6 mm විෂ්කම්භය ඇති සිදුරු 9 ක් විද දැල පයිප්පවලට සවි කිරීම සඳහා රු.49,680 ක් ඇස්තමේන්තු කර එම මුදලම ගෙවා තිබුණද දැල GI පයිප්පවලට සවි කර තිබුණේ ¼ ₺ ප්‍රමාණයේ කම්බියකිනි.

(ඉ) **<u>වේරවත්ත ශ්‍රී විජය පාර වමට ඇති 1 වන අතුරු මාර්ගය සහ තොටවත්ත ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවතේ අංක 29 නිවස අසලින් ඇති අතුරු මාර්ගය</u>**

පිළිවෙලින් රු.287,817 ක් හා රු.189,750 ක් ඇස්තමේන්තු කර ඉහත මාර්ග දෙක සඳහා කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා තිබූ අතර 2015 මැයි 22 දින සභාවේ තාක්ෂණ නිලධාරී සමග සිදු කළ භෞතික පරීක්ෂාවේදී මාර්ග දෙපස පදිංචිකරුවන් විසින් නිවෙස්වල අපජලය මාර්ගයට බැස්සවීම සඳහා කුට්ටි ගල් ගලවා තිබූ අතර කිසිදු සැලැස්මකින් තොරව මාර්ගය පළුදු කර පීවීසී ඩවුන් පයිප්ප දමා තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3.3 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) **<u>සැලසුම් කම්ටු දීමනා ගෙවීම</u>**

(i) පැමිණීමේ ලේඛන හා නිවාඩු ලේඛනවලට අනුව සභාවේ ලේකම් හා විෂය ලිපිකරු රාජකාරි නිවාඩු සහ පෞද්ගලික නිවාඩු ලබා ගෙන තිබූ දින 21 ක් වෙනුවෙන් රු.13,650 ක් සැලසුම් කම්ටු දීමනා ලබා ගෙන තිබුණි.

(ii) 2014 වර්ෂයේ කෙසෙල්වත්ත උප කාර්යාලයේ පවත්වා තිබූ සැලසුම් කම්ටු පිළිබඳ සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර සටහන්වල කම්ටු නිලධාරීන්ගේ පිටවූ වේලාව අනුව රාජකාරි වේලාවෙන් පසුව පැය 2 ක කාලයක් කම්ටුව පවත්වා නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව 2004 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක LG/07/2004 දරන චක්‍රලේඛයේ 15 ඡේදයට පටහැනිව දින 14 ක් සඳහා රු.45,500 ක් කම්ටු දීමනා ගෙවා තිබුණි.

(ආ) **<u>JCB යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය</u>**

සභාවට අයත් JCB යන්ත්‍රය 2014 වර්ෂය තුළ කිලෝ මීටර් 1291.2 ක් ධාවනය කිරීමට ඉන්ධන ලීටර් 8842 ක් සඳහා රු.839,990 ක් ගෙවා තිබූ අතර වාහනයේ අළුත්වැඩියා වියදම හා ටයර් ටියුබ් මිලදී ගැනීම වෙනුවෙන් වර්ෂය තුළ රු.399,795 ක් ද යන්ත්‍ර ක්‍රියාකරු වෙනුවෙන් අතිකාල පැය 1837.50 ක් සඳහා රු.123,993 ක් ද ගෙවා තිබුණි. ඒ අනුව වර්ෂය තුළ රු.1,363,778 ක් යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය වෙනුවෙන් දරා තිබුණද යන්ත්‍රය කුලියට දීමෙන් සභාවට ලැබී තිබූ

ආදායම රු.874,940 ක් පමණක් වී තිබුණි. එමෙන්ම යන්ත්‍රය සේවයේ යෙදවීමට අදාල ලේඛනයක් සභාව විසින් නඩත්තු කර නොතිබුණි

(ඈ) **<u>හානි හා පාඩු</u>**

(i) සභාවේ ඉල්ලීමකින් තොරව දිවි නැගුම දෙපාර්තමේන්තුව මගින් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලබා දී තිබූ GI බට 512 න් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 07 දින වන විට බට 106 ක් පමණක් තිබුණි. මෙම බට ලැබීම් හෝ නිකුත් කිරීම් සම්බන්ධ කිසිදු විස්තරයක් සභාවේ තොග පොත්වල හෝ වෙනත් කිසිදු ලේඛනයක සටහන් කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවලට අනුව බැහැරට ගෙන ගොස් ආපසු භාර දී නොතිබූ රු.3,697 ක් වූ පොත් 34 ක වටිනාකම අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය